යහපත් ශ්‍රී ලංකාවක් සඳහාවූ සංඝ සංසදය
சிறந்த இலங்கைக்கான சங்க மன்றம்
SANGHA FOR BETTER SRI LANKA

உலகத் தமிழர் பேரவை
Global Tamil Forum

**ජාතික සංවාදයක් ආරම්භ කිරීම : සෑම පුරවැසියෙකුටම බියෙන් හෝ සැකයෙන් තොරව, සමාන අයිතිවාසිකම් බුක්ති විඳිමින්, ගෞරවනීය ලෙස විශ්වාසයෙන් යුතුව සාමකාමීව ජීවත්විය හැකි ශ්‍රී ලංකාවක්**

යහපත් ශ්‍රී ලංකාවක් සඳහා වූ සංඝ සංසදය හා ගෝලීය දමිළ සංසදය විසින් ඒකාබද්ධව දියත් කරන ලද වැඩසටහන - ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා, ජනතාව අතර සිදුකරන සංවාදය

(විවිධ නිකායවලට අයත් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලාගෙන් සමන්විත) යහපත් ශ්‍රී ලංකාවක් සඳහා වූ සංඝ සංසදයේ හා ගෝලීය දමිළ සංසදයේ සාමාජිකයන් ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා මෙම ජාතික සංවාදය දියත් කිරීමේ කාර්යයෙහි පෙරමුණේ සිටින බව නිහතමානීව දැනුම් දෙමු. ශ්‍රී ලංකාවේ ජීවත්වන විවිධ ප්‍රජාවන් අතර අවබෝධය වැඩිදියුණු කර, සාමය ප්‍රවර්ධණය කිරීමේ අරමුණින් අප වසරක කාලයක් පමණ කටයුතු කරමින් සිටියෙමු. මේ සඳහා නේපාලයේ නාගර්කෝට් නගරයේ 2023 අප්‍රේල් මාසයේ පවත්වන ලද මූලික සාකච්ඡාව එකිනෙකාගේ දෘෂ්ඨි කෝණය දැන ගැනීමටත්, මෙම ජාතික සංවාදය ආරම්භ කිරීම සඳහා ඒකාබද්ධව රාමුවක් නිර්මාණය කිරීමටත් අපට උපකාරී විය. මෙය ශ්‍රී ලංකාව හා ඩයස්පෝරා ප්‍රජාවන් විසින් පළමු වතාවට ඒකාබද්ධව දියත් කරනු ලබන වැදගත් මූලාරම්භයක් වේ. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට රැගෙන යාම සඳහා අප
'හිමාලයා ප්‍රකාශනය' නිකුත් කළෙමු.

අද දින මේ සඳහා නිල ජාතික සංවාදය ශ්‍රී ලංකාව තුළ ආරම්භ කිරීම සනිටුවන් කරයි. මෙම ජාතික සංවාදයේ අප සමඟ එකතුවන ලෙස පමණක් නොව, එකිනෙකා සමඟ ඔබගේම එම සංවාදය ආරම්භ කරන ලෙසත් සියලු ශ්‍රී ලාංකික පුරුවැසියන්ගෙන් අප ඉල්ලා සිටිමු. ඔබ සමඟ එකතු වී මෙම දැක්ම යථාර්ථයක් කර ගැනීම සඳහා අප ඇපකැප වී සිටිමු. ශ්‍රී ලංකාව තුළ ජීවත්වන (සිංහල, දමිළ හා මුස්ලිම්) සියලු ප්‍රජාවන්ට අයත් නිහඬ බහුතරය තමන්ගේ සිවිල් යුතුකම ඉටුකිරීම සඳහා සක්‍රියව දායකත්වයක් ලබා දෙමින්, මෙම ජාතික සංවාදය අවංක ජාතික ව්‍යාපාරයක් ලෙස මෙයෙහවනු ඇති බව අපගේ විශ්වාසයයි. මෙයින් අපට ලැබිය හැකි ඉතා අගනා ත්‍යගය වනුයේ නව යුගයක් උදාවීම වේ; එවැනි නව යුගයක සෑම පුරවැසියෙකුටම බියෙන් හෝ සැකෙන් තොරව, සමාන අයිතිවාසිකම් භුක්ති විඳිමින්, ගෞරවනීය සහ විශ්වසනීය ලෙස සාමකාමීව ජීවත් විය හැකිය.

**මෙම සංවාදයේ පසුබිම**

ශ්‍රී ලංකාව විශාල යෝධ විභවයක් සතු ජාතියක් වේ. ඉතිහාසය පුරාවටම එය ඔප්පු වී ඇත. එහි ප්‍රමාණය හා කුඩා ජනගහණය හා සංසදනය කරන විට රටේ වැදගත්කම සැමවිටම සාපේක්ෂව ඉහළ ප්‍රමාණයක තිබේ. වසර 75 කට පෙර අලුතෙන් බිහි වූ නිදහස් ශ්‍රී ලංකාව සාමකාමී හා සශ්‍රීක ප්‍රජතන්ත්‍රවාදී රජ්‍යයක් ලෙස නැගිටීම සඳහා අවශ්‍ය සෑම ගුණාංගයක්ම සතුව තිබිණි. (එවකට) Ceylon ලෙස හඳුන්වන ලද ශ්‍රී ලංකාව ශත වර්ෂ ගණනාවක් පැවැති යටත් විජිතවාදී පාලනයෙන් මිදී නැගී සිටීමට වෙර දරන අනෙකුත් බොහෝ රටවල්වලට සාර්ථකත්වය සඳහා නිශ්චිත සැලැස්මක් ලබාදෙනු ඇතැයි විශ්වාස කරන ලදී. කෙසේවෙතත්, බොහෝ රටවල්වලට - විවිධ ජාතීන් හා ආගමික කණ්ඩායම් ජීවත් වූ රටවල්වලට - මෙම පරිවර්තනය ඉතා දුෂ්කර එකක් වූ අතර, ශ්‍රී ලංකාවද එයට ව්‍යතිරේකයක් නොවීය. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාව එළඹූ ව්‍යවස්ථාමය හා සංවර්ධන මාර්ගය අවසානයේදී 2022 වසරේ බංකොලොත් රටක් ලෙස පත් කරන තත්ත්වයට තල්ලු කළේය. සියලු ප්‍රජාවන්ට අයත් ඉතා දිළිඳු හා අඩු ආදායම් පවුල් කෙරෙහි මෙම බංකොලොත් තත්ත්වය ඇති කළ බලපෑම දැන් සියලු දෙනාටම බලාගත හැකිව තිබේ.

දේශපාලනික වශයෙන් පොළොඹවන ලද ප්‍රචණ්ඩත්වය හා ප්‍රති ප්‍රචණ්ඩත්වය - සමාජ හා ආර්ථික කරුණු හේතුවෙන් පොළඹවන ලද ප්‍රචණ්ඩත්වය හෝ ජනවාර්ගික, භාෂාමය හා ආගමික වෙනස්කම් හේතුවෙන් පොළඹවන ලද ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවේ තීරණාත්මක ලක්ෂණයක් විය. දැඩි බලපෑමක් ඇති කළ සිදුවීම වූයේ ජනවාර්ගික ගැටුම හා එහි ප්‍රතිඵලයක් ලෙස වසර 30 ක කාලයක් සිදු වූ සිවිල් යුද්ධය වේ. එහි සෘජු මානුෂීය පිරිවැය විශ්මයජනක වේ - ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් මිය ගිය අතර, දහස් ගණන් පුද්ගලයන් අතුරුදහන් විය; දස ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් අවතැන් වූ අතර, මෙම තත්ත්වය නව 'දමිළ ඩයස්පෝරාව' බිහි කළේය. මෙම පාඩු හා හානි එක ප්‍රජාවකට පමණක් සීමා නොවූ අතර, දමිළ ප්‍රජාව කෙරෙහි ඇති වූ බලපෑම සාපේක්ෂව ඉහළ අනුපාතයක තිබිණි.

ප්‍රචණ්ඩත්වය විසින් සිදුකරන ලද වක්‍ර බලපෑමද එලෙසම හානිදායක විය. රට දශක ගණනාවක් හදිසි තත්ත්වය යටතේ පාලනය වූ අතර, දැඩි ලෙස සිදුවූ මිලිටරිකරණය, මානව හිමිකම් හා නිදහස නොසලකා හැරීම, වධහිංසා හා රැඳවුම් මධ්‍යස්ථානවල සිදුවූ මරණ, අඛණ්ඩව පැවතුණු දූෂණය වැනි හේතු නිසා ආත්මාර්ථකාමී දේශපාලන පන්තියක් බිහිවිය. එම දේශපාලන පන්තිය සමාජය කෙරෙහි සහකම්පනයෙන් තොරව සිටි අතර, දීර්ඝ කාලයක් ඔඩු දුවමින් සිටී. ජනවාර්ගික හා ආගමික ගැටුම්ද ඇතුළුව ජනතාවගේ ප්‍රශ්න විසඳීමේදී ධාරිතාවයෙන් තොරව සිටියේය. දේශපාලන හා පාලන පද්ධති පිළිබඳ ජනතාවගේ විශ්වාසය පහළම මට්ටමට කිඳා බැස්සේය. එවැනි තත්ත්වයන් තුළ රට දැඩි ආර්ථික අර්බුදයකට මුහුණදීම විශ්මයක් නොවේ.

කෙසේවෙතත්, මෙම පිළිකුල් සහිත තත්ත්වයන් හේතුවෙන් සිදුවූ නව පිබිදීම හා සංවේදී පුරවැසියන් කිහිප දෙනෙක් විසින් සිදුකරන ලද නව මුලපිරීම් මෙම අඳුරු වළාකුළු මැද රිදී රේඛාවන් නිර්මාණය කර ඇත. එවැනි අවංක ප්‍රවේශයක් වන්නේ යහපත් ශ්‍රී ලංකාව සඳහා වූ සංඝ සංසදය හා ගෝලීය දමිළ සංසදයේ ක්‍රියාධරයන් විසින් ශ්‍රී ලංකාවේ ජීවත්වන විවිධ ප්‍රජාවන් අතර අවබෝධය ප්‍රවර්ධනය කර, සාමය ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන වේ.

### නාගර්කෝට් සංවාදය (Nagarkot Dialogue)

මෙම පාර්ශ්වයන් කිසි දිනක යා කළ නොහැකි වෙනස්කම් සහිත ප්‍රතිවිරුද්ධ විරුද්ධ පාර්ශ්වයන් බව සාමාන්‍යයෙන් පවතින තත්ත්වය තුළ, මෙහි පවත්වන ලද සාකච්ඡාවලදී පාර්ශ්වයන් අතර පොදු ලක්ෂණ පවතින බව හෙළි විය - ශ්‍රී ලංකාවේ ජනවාර්ගික හා ආගමික සමගියට බාධා පමුණුවන මූලික කරුණු ' අවබෝධය නැතිවීම' හා 'එකිනෙකා අතර පවතින බිය' යන කරුණ බව පැහැදිලි විය - *සියලු ජනතාව සඳහා යහපත් ශ්‍රී ලංකාවක් සඳහා වූ පොදු දැක්මක්.*

විශේෂිත වූ සිය ඓතිහාසික අනන්‍යතාවය හා තමන් සතු (එකම) රට වන ශ්‍රී ලංකාව පිළිබඳ තමන් ඇති අභිමානය ආරක්ෂා කර ගැනීම පිළිබඳ සිංහල බෞද්ධ ප්‍රජාව තුළ බියක් පැවතීය. මෙම පසුබිම තුළ, සුළු ජාතික ප්‍රජාවන් හා දමිළ ඩයස්පෝරාව ඇතුළු විවිධ බලවේග සිය විරුද්ධවාදීන් ලෙස ඔවුන් දකිති. අනෙක් අතට දමිළ ජනතාවගේ හැඟීම් සහ දේශපාලනය සැමවිට සුළු ජාතියක් වශයෙන් තමන් මුහුණපාන තත්ත්වය පිළිබඳ බිය විසින් මෙහෙයවන ලදී - ඉතිහාසයේ දීර්ඝ කාලයක් තමන් ජීවත් වූ වාස භූමි හා තමන්ටම විශේෂිත වූ අනන්‍යතාවය රාජ්‍යය විසින් සිතාමතා සිදුකරන ලද පියවරයන් හේතුවෙන් අහිමි වීමේ බියක් එම ප්‍රජාව තුළ පවතී.

බෞද්ධ භික්ෂූන් පිළිබඳ දමිළ ජනතාව අතර දැඩි සෘණාත්මක ආකල්පයක් පවතී. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අරගලය දිග්ගැස්සීමේ හා දුක් වේදනා ඇති කිරීමේදී බෞද්ධ භික්ෂූන් ප්‍රධාන සාධකයක් වූ බව ඔවුන් සිතති. නමුත් මෙම දැක්ම, සියවස් ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් සිදුකර ඇති ඉතා අගනා කාර්යභාරයන් කෙරෙහි අවධානයක් යොමු නොකරයි. තමන්ගේ ප්‍රජාවන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා උන් වහනසේලා විසින් කරන ලද මැදිහත්වීම්ද මෙයට ඇතුළත් වේ. එමෙන්ම බහුතර ජනතාව අතර පවතින පොදු මතයක් වන්නේ ආර්ථික වශයෙන් ශක්තිමත් වී ඇති බලපෑම් සහිත දමිළ ඩයස්පෝරාව ශ්‍රී ලංකාව විනාශ කිරීමේ කාර්යයෙහි යෙදී සිටින බවය. තමන් දැනට ජීවත්වන රටවල්වල සිදුවී තිබෙන අවතැන්වීම්, ඔවුන් මුහුණ දෙන

ශාරීරික හා මානසික දුෂ්කරතා සැලකිල්ලට නොගෙන හෝ පිළිනොගෙන, සියලු දෙයක්ම තමන් උපන් රටේ මුහුණදීමට සිදු වූ තත්ත්වයන් නිසා ඇති වූ බව ඔවුන් සිතන බව ඔවුන් සිතන බව බහුතර ජනතාවගේ මතය වේ.

මෙම එකිනෙකට වෙනස් වූ මතයන් හා බිය සැමවිටම සාධාරණ කරුණු පදනම් කර ගත් ඒවා බොහෝ දේශපාලන නායකයන් හා ආගමික නායකයන් කිහිප දෙනෙක් තමන්ගේම න්‍යාය පත්‍රය අනුව කටයුතු කරමින් සිටින තවත් පුද්ගලයන් කිහිප දෙනෙක් ජනතාව තුළ මෙලෙස පවතින බිය තමන්ගේ ආත්මාර්ථකාමී අරමුණු ඉටුකර ගැනීම සඳහා සැමවිටම පාවිච්චි කර ඇත; ඉදිරියටද එලෙස පාවිච්චි කරනු ඇත. එමනිසා, ජාතික සංවාදයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජනතාව වූ ඔබ ආමන්ත්‍රණය කිරීමට අපට අවශ්‍ය විය. නේපාලයේ නාගර්කෝට්හි සිදුවූ එම සංවාදය ශ්‍රී ලංකාව පුරා සෑම ප්‍රජාවක් හා ඩයස්පෝරා ප්‍රජාවන් අතර නැවත සිදුවිය යුතුව ඇත. එවැනි ක්‍රියාවලියක් සඳහා මගපෙන්වීමේ ලේඛණයක් අවශ්‍ය වන අතර, සියලුම ප්‍රජාවන්ට අයත් බහුතර පුද්ගලයන්ට එම ලේඛණය හා තමන්ව සම්බන්ධ කර ගත හැකිය. නාගර්කෝට් සංවාදය පදනම් කරගෙන ඇති 'හිමාලයා ප්‍රකාශනය' එම ඒකාබද්ධ ගමනේදී අප ලබා ගත් ඉතා වැදගත් ප්‍රතිඵලයක් වේ.

**හිමාලයා ප්‍රකාශනය**

'හිමාලයා ප්‍රකාශනය' ශ්‍රී ලංකාව සඳහා නව හා ප්‍රගතිශීලි දැක්මක් ඉදිරිපත් කරන ප්‍රායෝගික ලේඛණයක් වේ. එය කිසිම ප්‍රජාවක් හා සම්බන්ධ මූලික මතවාදී කරුණුවලට සම්බන්ධ වී නොමැත. මෙම ප්‍රකාශය පහත සඳහන් ප්‍රකාශ හයකින් සමන්විතය;

රටේ බහුත්ව ලක්‍ෂණය ආරක්‍ෂා කර, ප්‍රවර්ධනය කිරීම; එම තත්ත්වය තුළ, කිසිම ප්‍රජාවක් සිය අනන්‍යතාවය හා අභිමානය අහිමි වීම පිළිබඳ තර්ජනයකට මුහුණ නොදේ.

ආර්ථික අර්බුධදය ජය ගැනීම; දේශීය නිෂ්පාදනය දිරිගන්වා, විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකියන් හා අනෙකුත් පුද්ගලයන්ගේ ආයෝජනවලට පහසුකම් සැලසීම; හා රට සංවර්ධන මාර්ගයක පිවිසීම තහවුරු කර, ශ්‍රී ලංකාව මධ්‍යම ආදායම් රටක් බවට පත් කිරීම සඳහා උචිත සංවර්ධන මොඩලයක් තෝරා ගැනීම.

තනි පුද්ගල හා සාමූහික අයිතීන් තහවුරු කර, සියලු ජනතාව අතර සමානාත්මතාවය හා සමාන පුරවැසිභාවය ප්‍රවර්ධනය කරන, වගවිය යුතු ආයතන ස්ථාපිත කර, පළාත් සඳහා ප්‍රමාණාත්මක ලෙස බලය බෙදාදීම තහවුරු කරන නව ව්‍යාවස්ථාවක් හඳුන්වාදීම; එය සිදුවන තෙක් වත්මන් ව්‍යවස්ථාවේ තිබෙන බලය බෙදා ගැනීමේ ප්‍රතිපාදන විශ්වසණීය ලෙස ක්‍රියාත්මක කිරීම.

එක්සත් හා නොබෙදු රටක් තුළ බලය බෙදීම, ජනතාවගේ ආගමික, සංස්කෘතික හා අනෙකුත් අනන්‍යතා පිළිගැනීම හා එවැනි අනන්‍යතාවලට ගරු කිරීම; ජනවාර්ගික කණ්ඩායම් හා ආගමික කණ්ඩායම් අතර විශ්වාසය ගොඩනැගීම සඳහා කටයුතු කිරීම.

සංහිඳියාව ස්ථාපිත වී, අතීතයෙන් පාඩම් ඉගෙන ගැනීම සඳහා කැප වී සිටින ශ්‍රී ලංකාවක් සඳහා වූ දැක්ම; එවැනි දුකක් මතු කිසි දිනක සිදු නොවීම සඳහා වගවීමද ඇතුළුව පියවරයන් නිර්මාණය කිරීම.

ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ගිවිසුම් හා ජාත්‍යන්තර බැඳීම්වලට අනුකුලවීම, ස්වාධීන හා ක්‍රියාශීලි විදේශ ප්‍රතිපත්තියක් පිළිපැදීම සඳහා පියවරයන් ගැනීම හා ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදි සාමකාමී හා සෞභාග්‍යමත් ජාතීන් අතර ශ්‍රී ලංකාවටද අභිමානවත් ස්ථානයක් ලබා ගැනීම තහවුරු කිරීම.

**ඊළඟ පියවරයන්**

බෞද්ධ භික්ෂූන් හා ගෝලීය දමිළ සංසදය තමන් ශ්‍රී ලංකාවේ ප්‍රජාවන්වල යම් කොටස්වල අදහස් පමණක් නියෝජනය කරන ජන කණ්ඩායමක් බව දැන සිටිති. අප සියලු පුරවැසියන්ගේ හෝ කණ්ඩායම්වල මතය නියෝජනය නොකරමු. ඒවාගේම අප යොමු වී තිබෙන මෙම මාර්ගය ධර්මිෂ්ඨ මාර්ගයක් බව අප දැන සිටිමු. මෙය ශ්‍රී ලංකාවේ නිදහසින් පසු එදාමෙදා තුල දියත් කරන ලද ඉතා නිර්භීත පළමු ඒකාබද්ධ මුලපිරීම වේ. මෙය ශ්‍රී ලංකාවේ හා ඩයස්පෝරාවේ අන්තර් ආගමික අවබෝධය හා සමගිය ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනා සඳහා වූ සාමය හා ස්තිරසාරත්වයෙන් යුක්ත යහපත් අනාගතයක් ගොඩනැගිය හැකි පදනම වේ.

දිස්ත්‍රික්ක 25 තුළ අන්තර් ආගමික ක්‍රියාකාරි කණ්ඩායම් ස්ථාපිත කිරිමේ අරමුණින් විවිධ ආගමික ප්‍රජාවන් හා ආගමික නායකයින් කෙරෙහි දැනට අප අවධානය යොමු කර ඇති අතර හිමාලය ප්‍රකාශයේ ඇති බොහෝ සාධනීය ප්‍රතිඵල අදාළ දේශපාලන ක්‍රියාවලින් හරහා පමණක් ළඟා කර ගත හැකිවනු ඇත එමනිසා මෙම මුල පිරීම පිළිබඳ අප ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ හා පාර්ශ්වකරුවන් වෙත දැනුම් දී ඇති අතර, මෙම අභියෝගයට මුහුණදීම සඳහා එකාමෙන් නැගී සිටින ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිට ඇත්තෙමු. කෙසේවෙතත්, මෙම දේශපාලන ක්‍රියාවලින් සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ජනතාව හා ඩයස්පෝරාව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකළ යුතුව ඇත.

ඩයස්පෝරාව ජීවත්වන රටවල්වල රජයන් සමඟ හා ඉන්දියාව සමඟද අප සක්‍රියව සම්බන්ධ වී කටයුතු කරන්නෙමු. විවිධත්වය යථාර්ථයක් බවට පත්කර, එය සමරනු ලබන මෙම රටවල්වල ජීවන අත්දැකීම් හා අපගේ වෘත්තීමය හා පුද්ගලික අත්දැකීම් සහිතව විදේශ රටවල්වල ජීවත්වන බොහෝ ශ්‍රී ලාංකිකයන්ට ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වර්ධනයන් සඳහා දායකත්වයක් ලබාදිය හැකිය.

මෙම ජාතික සංවාදය ආරම්භ කිරීම සඳහා අතිපූජ්‍ය මහානායක හිමිවරු ඇතුළු ශ්‍රී ලංකාවේ සියලු ආගම්වල ජ්‍යේෂ්ඨ නායකයන්ගෙන් අපට ආශිර්වාදය ලැබී ඇත. ජනාධිපතිතුමා, විවිධ දේශපාලන නායකයකතුමන්ලා මෙන්ම අන්තර් ආගමික අවබෝධය, සාමය, සමගිය, සංහිදියාව හා සියලු ශ්‍රී ලංකාවාසීන් සඳහා සමානත්වය හා සශ්‍රීකත්වය ළඟා කර ගැනීම සඳහා කටයුතු කරන සිවිල් සමාජ ක්‍රියාදරයන් හා සංවිධානද අපගේ ඒකාබදධ අභිලාශයන් පිළිගැනීම නිසා අප ඇත්ත වශයෙන්ම අතිශය සතුටට හා ප්‍රබෝධයට පත් ව ඇත.

අප අද ආරම්භ කරන මෙම ගමන දීර්ඝ හා දුෂ්කර ගමනක් වේ; නමුත් එය වගවීම් සහිත පාලන තන්ත්‍රයක් නිර්මාණය කිරීමටත්, දීර්ඝකාලීනව පවතින ජනවාර්ගික දුක් ගැනවිලි හා ආර්ථික මන්දගාමී තත්ත්වය විසඳා ගැනීමටත් උචිත වාතාවරණයක් නිර්මාණය කරනු ඇත. මෙම ජාතික සංවාදයෙන් ළඟා කර ගන්නා සාර්ථකත්වය ශ්‍රී ලංකාව සෘජු ආර්ථික සංවර්ධන හා සාමාන්‍ය ජනතාව සඳහා ඉහළ ජීවන තත්ත්වයන් ඇති කිරීම කෙරෙහි හැකියාවක් නිර්මාණය කරනු ඇත. ඒවාගේම ජාත්‍යන්තර ප්‍රජාව තුළ ප්‍රගතිශීලී හා ගරුත්වයෙන් යුතු රටක් ලෙස ශ්‍රී ලංකාවේ නම යළිත් ස්ථාපිත කරනු ඇත.

නාගර්කෝට් සංවාදය මෙම සතියේ ශ්‍රී ලංකාවේ දිගටම සිදුකරන අතර, හිමාලයා ප්‍රකාශනය දැන් ප්‍රසිද්ධ ලේඛණයක් බවට පත් වී ඇත. මේ සතියේ අප ආරම්භ කරන මෙම ජාතික සංවාදය ජාතික ව්‍යාපාරයක් ලෙස පරිවර්තනය කිරීම අත්‍යවශ්‍ය වේ. එවිට සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකටම බියෙන් සැකෙන් තොරව, ගෞරවය හා විශ්වාසය සහිතව සාමකාමීව ජීවත්වීමට හැකිවනු අතර, සමාන අයිතිවාසිකම්ද බුක්ති විඳිය හැකිය. මෙහි සාර්ථකත්වය ශ්‍රී ලංකා ජනතාව වන අප මත රැඳී ඇත.

.